<table>
<tr><td colspan="3"><u>මධ්‍යම පළාත් සභාවේ අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) තනතුරට සුදුසු නිලධරයෙකු පත් කිරීමේ<br>සම්මුඛ පරීක්ෂණයේ ලකුණු නිර්ණායක</u></td></tr>
<tr><td></td><td>ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන්</td><td>උපරිම ලකුණු</td></tr>
<tr><td>01.<br>ජ්‍යෙෂ්ඨත්වය<br>ලකුණු 40</td><td>01. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරියෙකු ලෙස I වන ශ්‍රේණියේ සම්පූර්ණ කර ඇති මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය හෝ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරියෙකු ලෙස II වන ශ්‍රේණියේ වසර 06ක සක්‍රීය සේවා කාලය ඉක්මවා සම්පූර්ණ කර ඇති අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>ලකුණු 40</td></tr>
<tr><td>02. කුසලතාවය<br>ලකුණු 60</td><td><u>02.1. කාර්යය සාධන ඇගයුම්</u><br>අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිත කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>(වසරකට ලකුණු 03 බැගින් වසර 05ක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)<br><table><tr><td>විශිෂ්ටයි</td><td>ලකුණු 03</td></tr><tr><td>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ</td><td>ලකුණු 02</td></tr><tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 01</td></tr></table></td><td>ලකුණු 15</td></tr>
<tr><td></td><td><u>02.2. අධ්‍යාපන සුදුසුකම්</u><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත්<br><table><tr><td>02.2.1. පශ්චාත් උපාධිය, සමාන හෝ ඉහළ සුදුසුකම</td><td>ලකුණු 05</td></tr><tr><td>02.2.2. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව</td><td>ලකුණු 03</td></tr></table><br>(මෙහිදි බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස සැළකූ උපාධිය, කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම හා ශ්‍රේණි උසස් කිරීම් සඳහා සළකා බැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ පශ්චාත් උපාධි හැර, අනෙකුත් සුදුසුකම් අතරින්, එක් එක් ක්ෂේත්‍රයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)</td><td>ලකුණු 05</td></tr>
<tr><td></td><td><u>02.3. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද</u><br><br>02.3.1. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරක ස්ථිර/වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීම - (වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05)<br><br>02.3.2. තම නිත්‍ය තනතුරට අතිරේකව සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීම - (වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03)<br><br>(සේවය කරන ලද කාලය සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද විධිමත් පත් කිරීම් ලිපි ඉදිරිපත් කළ යුතුය)</td><td>ලකුණු 05</td></tr>
<tr><td></td><td><u>02.4. ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා</u><br><br>02.4.1. දේශීය/විදේශීය පුහුණු පාඨමාලාවකට (මාස 03 හෝ ඊට වැඩි) - සහතික 01කට ලකුණු 01 බැගින් උපරිම සහතික 02කට)<br>02.4.2. දේශීය/විදේශීය පුහුණු පාඨමාලාවකට (මාස 03ට අඩු දින 10ට වැඩි) - සහතික 01කට ලකුණු 01 බැගින් උපරිම සහතික 02කට)<br>02.4.3. දේශීය/විදේශීය පුහුණු පාඨමාලාවකට (දින 10ට අඩු) - සහතික 01කට ලකුණු 01 බැගින් උපරිම සහතික 01කට)</td><td>ලකුණු 05</td></tr>
</table>

**<u>02.5. සේවා ඇගයීම් /ප්‍රශංසා සහතික(පොදු 230 බී ආකෘතිය) /සම්මාන සහතික /ජයග්‍රහණ</u>** — **ලකුණු 05**

02.5.1 ජාතික මට්ටම (ලකුණු 05 බැගින් 01 ක් සඳහා )
02.5.2. පළාත් මට්ටම (ලකුණු 02 බැගින් 02 ක් පමණක් සළකා බැලේ )
02.5.3. කළාප මට්ටම (ලකුණු 01 බැගින් 02 ක් පමණක් සළකා බැලේ )
02.5.4. ප්‍රශංසා සහතික (ලකුණු 01 බැගින් උපරිම 02 ක් පමණක් සළකා බැලේ )

(මෙහිදී අදාළ වන ලේඛන පෞද්ගලික ලිපි ගොනුව අනුව වර්තමාන ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)

**02.6. <u>ක්ෂේත්‍රයට අදාළව හඳුන්වා දී ඇති නවෝත්පාදන/නව්‍යකරණ වැඩසටහන් හා ව්‍යාපෘති</u>** — **ලකුණු 15**

උදා:

- ඩිජිටල් හා තාක්ෂණික නවෝත්පාදන
- දත්ත මත පදනම් වූ සැලසුම්කරණ නව ක්‍රම
- ව්‍යාපෘති කළමනාකරණ නව ක්‍රම
- ජන සහභාගී සංවර්ධන සැලසුම්
- ආයතනික කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා

(එකකට ලකුණු 03 බැගින් වැඩසටහන් හා ව්‍යාපෘති 5කට)

(මේ සඳහා අදාළ වන ලේඛණ ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය)

**02.7. <u>කේන්ද්‍රිය නිපුණතාව ඇගයීම</u>** — **ලකුණු 10**

සංකීර්ණ ගැටළුවක් සඳහා අයදුම්කරුට විසඳුමක් ලබා දීමට සිදු වූ අවස්ථාවක් පහත ක්‍රමවේදයක් ඔස්සේ විස්තර කිරීම අනුව ලකුණු ලබා දෙනු ලැබේ.
(Power point presentation ඔස්සේ විනාඩි 10ක ඉදිරිපත් කිරීමක්)

<u>පිළිතුරු ලබා දීමේ ක්‍රමවේදය</u>
ගැටළුව(Problem) -- ක්‍රියාකිරීම(Action) --ප්‍රතිඵලය(Result)…එනම් PAR ක්‍රමවේදය

හෝ

අවස්ථාව(Situation) -- කාර්යය(Task) -- ක්‍රියාකිරීම(Action) -- ප්‍රතිඵලය(Result) ...එනම් STAR ක්‍රමවේදය

අදාළ අයදුම්කරුගේ කේන්ද්‍රීය නිපුණතාවය පහත සඳහන් මාර්ගෝපදේශ මත පදනම්ව ඇගයීමට ලක් කරනු ඇත.

| **ලකුණු ලබා දිමේ නිර්ණායකය** | **ප්‍රමාණනය** |
|---|---|
| 02.7.1. අදාළත්වය/ අන්තර්ගතය | 02 |
| 02.7.2. ඉදිරිපත් කිරීම හා සන්නිවේදන හැකියාව | 02 |
| 02.7.3. කාල කළමනාකරණය | 02 |
| 02.7.4. ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීම | 02 |
| 02.7.5. නායකත්වය, පෞරුෂත්වය හා ආකල්ප | 02 |

**මුළු ලකුණු** — **ලකුණු 100**